පොලිස් මාධ්‍ය කොට්ඨාසය
பொலிஸ் ஊடகப் பிரிவு
POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

දිනය Date 2025.10.20 පැය 1650 | දුරකථන අංකය Tel.NO 011-2887973 | මගේ අංකය My NO D/Media/Out/ 1919 /2025 | විද්‍යුත් ලිපිනය E-Mails dir.media@police.gov.lk

**රථවාහන වැරදි සම්බන්ධ දඩපත් මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ ගෙවීම් කිරීම පිළිබඳව මහජනතාව දැනුවත් කිරීම - රථවාහන මූලස්ථානය.**

රථවාහන වැරදි සම්බන්ධයෙන් ස්ථානීය දඩ මුදල් ගෙවීමේ පහසුකම මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ සිදුකිරීමට ඇති හැකියාව පිළිබඳ මහජනතාව දැනුවත් කිරීමේ අරමුණින් සංවිධානය කරන ලද මාධ්‍ය සාකච්ඡාවක් 2025.10.20 වන අද දින උදෑසන කාලයේදී රථවාහන, පාලන හා මාර්ග ආරක්ෂාව දිසාව භාර නියෝජ්‍ය පොලිස්පති ඩබ්.පී.ජේ.සේනාධීර මහතාගේ ප්‍රධානත්වයෙන් රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේදී පවත්වන ලදී.

මෙම ක්‍රමවේදය මගින් රථවාහන වැරදි සඳහා වූ දඩ මුදල් Gov pay යෙදුම මඟින් මාර්ගගත ක්‍රමවේදය හරහා ගෙවීම් කටයුතු සිදු කිරීමට හැකියාවක් ඇති බව මෙහිදී මහජනතාව දැනුවත් කිරීමට කටයුතු කරන ලදි. මෙම යෙදුම භාවිතා කරමින් මුදල් ගෙවීමේදී තම කාලය, ශ්‍රමය හා මුදල් ඉතිරි කර ගැනීමට ඇති හැකියාව හා මෙම ක්‍රමය මඟින් මුදල් ගෙවීමේදී එහි ආරක්ෂිත භාවය පිළිබඳව තවදුරටත් මෙහිදී කරුණු පැහැදිලි කරන ලදි.

මෙම අවස්ථාව සඳහා ශ්‍රී ලංකා පොලිසිය සමඟ මෙම කටයුතු සඳහා ඒකාබද්ධව කටයුතු කරනු ලබන ප්‍රවාහන හා මහා මාර්ග අමාත්‍යාංශයේ ඩිජිටල් කාර්ය සාධක බලකායේ හර්ෂ කුරුසිංහ මහතා, ලංකා Pay ආයතනය නියෝජනය කරමින් දිනුක පෙරේරා මහතා සහභාගී වූහ.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**